The Jornal of the Faculty of Humanities (JHU) (2024), Volume 32, Issue 2, 17-41
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# ජී. බී. සේනානායකගේ ඓතිහාසික නවකතා කෙරෙහි බටහිර සාහිත්‍යයේ බලපෑම පිළිබඳ විමර්ශනයක්

චින්තක රණසිංහ
රමේෂ් කාවින්ද හේවගේ

## Abstract

This study explores the nature of Western literary influence on G.B. Senanayake's historical fiction writings, which reflect a unique identity within Sinhala literature, as an independent literary creator and critic. The research problem addresses how Western literary elements shaped the historical novels written by G.B. Senanayake. The study examines how Western literary narrative traditions, from the Greek era to the twentieth century, were employed to foster literary thought. Both primary and secondary sources were utilized for this research, following qualitative research methodologies. The focus of this study was on historical novels such as Medha (1964), Varadatta (1967), Mudupani and Charumukha (1965), written by G.B. Senanayake. The analysis revealed that the fundamental principles of Western realism in the novel genre were also adopted in his historical fiction. The data analysis led to the conclusion that while G.B. Senanayake's historical novels are grounded in historical contexts, they also reflect influences of Western literary concepts.

**Keywords:** *G.B. Senanayake, Historical Fiction, Western Literature, Medha, Mudupani, Varadatta, Charumukha*

# හැඳින්වීම

නූතන සිංහල සාහිත්‍යය හා නූතන සිංහල සාහිත්‍ය විචාරය යන ක්ෂේත්‍ර දෙකෙහි ම පුරෝගාමී විද්වතකු ලෙස ජී. බී. සේනානායක (1913-1985) සැලකේ. ලාංකේය විශ්වවිද්‍යාලය හා එයට මුල් වූ යුනිවර්සිටි කොලිජිය (1921) ගොඩනැගීමේ ක්‍රියාවලියට සමාන්තර ව සේනානායකගේ ශාස්ත්‍රීය හා නිර්මාණ දායකත්වය ගොඩනැගුණු බව නිරීක්ෂණය කළ හැකි ය. සේනානායක කෙටිකතාකරුවකු ලෙස මෙන් ම නිදහස් කවියේ පුරෝගාමියකු ලෙස කරළියට පිවිසෙන්නේ 40 දශකයේ ය (එනම් ප්‍රථම සිංහල නවකථාව ලෙස සැලකෙන ගම්පෙරළිය පළ වූ දශකයේ ම ය). එහෙත් ඔහු තම ජීවිත කථාවක දී පවසන්නේ තම ප්‍රථම නවකථාව ලියා පළ කළේ වයස 50 දී බව යි. එයින් පෙනී යන්නේ කෙටිකතාව, කවිය මෙන් ම සාහිත්‍ය විචාරය යන ක්ෂේත්‍ර තුනෙහි සැලකිය යුතු පරිචයක් ලබා ගැනීමෙන් පසු හෙතෙම නවකතාකරණයට පිවිසි බවයි. සේනානායක රචනා කළ නවකතා එම කෘතිවල වූ පසුබිම පදනම් කොට ගනිමින් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය. ඒ මෙසේ යඃ

1. ලාංකේය සමාජ පසුබිම් කරගෙන රචනා වූ නවකතා.
2. පැරැණි ඉන්දියානු සමාජ පදනම් කොටගෙන රචනා වූ නවකතා.

මෙයින් ප්‍රථම කොටස ලෙස රුව (1982), උරගල (1984) ආදී නවකතා ප්‍රමුඛ තවත් නවකතා ගණනාවක් සැලකිය හැකි ය. දෙවන කොටස මේධා (1964), චාරුමුඛ (1965), වරදත්ත (1967), මුදුපාණි (2001), ආදී නවකතා සැලකිය හැකි ය.

මෙම ලිපියේ අධ්‍යයන ක්ෂේත්‍රය ඉහත නවකතාවලින් දෙවන ධාරාවට අයත් වන නවකතා හතර, එනම් මේධා, මුදුපාණි, වරදත්ත, චාරුමුඛ යන නවකතා තෝරා ගනිමින් ගොඩනැගෙයි. ඒ අනුව මෙම නවකතාවල චරිත නිරූපණය කෙරෙහි බටහිර යථාර්ථවාදී නවකථාව හා එහි මූලධර්ම බලපෑවේ ද බලපෑවේ නම් ඒ කුමනාකාරයෙන් ද යන්න මෙම අධ්‍යයනයේ දී අපගේ අවධානයට ලක් වේ.

සේනානායකගේ සමස්ත නිර්මාණ සාහිත්‍යය දායකත්වය මෙන් ම විචාර දායකත්වය යන දෙක ම සලකා බලන විට (ඔහුගේ

ප්‍රකට ජීවිත කතා තුන වන විනිවිදිමි අඳුර (1984), මගේ සිතුම් පැතුම් හා ජීවිතය (1986), මම එදා සහ අද (1991) යන කෘති තුන ද මෙම විචාර කතිකාවට අදාළ වන බව අපගේ මතයයි) කැපී පෙනෙන කරුණක් වන්නේ බටහිර සාහිත්‍යයේ විවිධ ධාරාවලින් ඔහු ලැබූ ආභාසය යි. මෙය විචාරක අවධානයට ලක් වී ඇති අතර එම සාකච්ඡාවල විශේෂ අවධානය යොමු වී තිබෙන්නේ සිංහල සාහිත්‍ය විචාර කතිකාව පෝෂණය කිරීමෙහි ලා සේනානායක බටහිරින් ලද ආභාසය පිළිබඳ ව යි.) විශේෂයෙන් ම බටහිර සාහිත්‍යයේ මූලිකාංග හා විචාරයේ මූලික සංකල්ප හඳුනා ගැනීම සඳහා බටහිර සාහිත්‍ය කෘති හා සංකල්පවලින් ලද හැකි දායකත්වය විශේෂ අවධානයට ලක් ව ඇත. එ මෙන් ම ග්‍රීක, රෝම සාහිත්‍යය එනම් බටහිර සම්භාව්‍ය සාහිත්‍යය සිංහල පාඨකයාට හඳුන්වා දීමටත්, බටහිර විශිෂ්ටතම නවකතා හා නාට්‍ය සිංහල පාඨකයාට හඳුන්වා දීමටත් ඔහු සුවිශාල දායකත්වයක් පළ කර ඇති අතර එම ක්‍රියාවලියේ දී ඔහුට ම අනන්‍ය වූ ක්‍රමවේදයක් ගොඩනගා ගැනීම විශේෂ තත්ත්වයකි.

එහෙත් සේනානායක තම නවකතා පෝෂණය කිරීම සඳහා විශේෂයෙන් ම පැරණි ඉන්දීය සමාජය පදනම් කොටගෙන රචිත නවකතා පෝෂණය කිරීම පිණිස බටහිර සාහිත්‍යය උපයෝගී කොටගත් ආකාරය පිළිබඳ මෙතෙක් අවධානයට යොමු වී නැත.

## සාහිත්‍ය විමර්ශනය

මෙම පර්යේෂණයේ දී ජී. බී. සේනානායකගේ ඉතිහාස විෂයයික නවකතා කෙරෙහි (Historical Novel) බටහිර විචාර සංකල්පයන්ගේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක නියැළෙන අතර මේධා, චාරුමුඛ, වරදත්ත, මුදුපාණි යන නවකතා කෙරෙහි මූලික අවධානය යොමු කෙරේ. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික දත්ත වශයෙන් සේනානායක විසින් රචනා කරන ලද ඉතිහාස විෂයික නවකතා වන මේධා, චාරුමුඛ, වරදත්ත හා මුදුපාණි යන නවකතා ද සාහිත්‍ය විචාර විෂයීය සංකල්ප හඳුන්වා දීමේ අරමුණින් රචිත නවකතා කලාව (1946), සාහිත්‍ය විග්‍රහය (1961), සාහිත්‍ය ධර්මතාව (1963), බටහිර ශ්‍රේෂ්ඨ නවකතා (1960), විචාර ප්‍රවේශය (1965) හා සාහිත්‍ය සේසත් (1960) යනාදී කෘති ද අධ්‍යයනයට ලක් කෙරිණි. එ මෙන් ම ස්වයං චරිතාපදාන වශයෙන් රචිත සාහිත්‍ය දර්ශන සිතුවිලි (1982), විනිවිදිමි අඳුර (2005), මගේ

සිතුම් පැතුම් (1986) හා මම එදා සහ අද (1991) යන කෘති ද යොදා ගැනිණි. ද්විතීයික දත්ත මූලාශ්‍රය යටතේ ඉතිහාස විෂයික අධ්‍යයනය හා ඉතිහාස විෂයික නවකතා සම්බන්ධයෙන් පළ කෙරුණු කෘති අධ්‍යයනයට ලක් කළ අතර ජී. බී. සේනානායකගේ සාහිත්‍ය භාවිතය සම්බන්ධයෙන් වෙනත් ලේඛකයන් විසින් ඉදිරිපත් කරන ලද විචාර ද අධ්‍යයනය කිරීමට යොමු විය.

ශාස්ත්‍රාලීයක පුහුණුවකින් පරිබාහිර ව ස්වාධීන බුද්ධිමතකු ලෙස සාහිත්‍යකරණයට ප්‍රවේශ වන සේනානායකගේ මූලික වශයෙන් අවධානයට ලක් වූ විෂය ක්ෂේත්‍රයක් ලෙස ග්‍රීක රෝම සාහිත්‍යය හඳුනාගත හැකි ය. ග්‍රීක සාහිත්‍යය යටතේ ප්ලේටෝ (428/427 – 348/347 BCE), ඇරිස්ටෝටල් (384 – 322 BC) ආදී චින්තකයන් විසින් ඉදිරිපත් කරනු දාර්ශනික හා සාහිත්‍ය සංකල්ප වෙත සේනානායකගේ අවධානය යොමු වී ඇත. තව ද හෝමර්ගේ ඉලියඩ් හා ඔඩිසි යන වීර කාව්‍ය ද ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය පිළිබඳ ව ද අවධානය යොමු කර ඇති අයුරු ඔහුගේ සාහිත්‍ය විචාර කෘති අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි ය. සේනානායක බටහිර විචාර සංකල්පයන්ගෙන් ලද ආභාසය ප්‍රමුඛ වශයෙන් ධාරා දෙකක් යටතේ පෙන්වා දිය හැකි ය.

1. බටහිර විචාර සංකල්ප ඍජු ව ම අධ්‍යයනය කරමින් ඒ පිළිබඳ සිය මතය පළ කිරීම.
2. සිංහල සාහිත්‍යය කෘති විචාරයට ලක් කිරීමේ දී හා සාහිත්‍ය සම්බන්ධයෙන් අදහස් පළ කිරීමේ දී බටහිර සාහිත්‍ය සංකල්ප යොදා ගැනීම.

Historical Novel යන ඉංග්‍රිසි වචනය මෙහි දී අපගේ භාවිතයට ගැනෙනුයේ ඉතිහාස විෂයයික නවකතා යන සිංහල යෙදුම මත පදනම් වෙමිනි. Historical Novel යන ඉංග්‍රීසි පදය ඓතිහාසික නවකතා යනුවෙන් ද භාවිතයට ගැනෙයි. ඓතිහාසික යන පදය පදිම විචාරාත්මකව විමසා බැලිමේ දී ඉතිහාස යන නාම ප්‍රකෘතියට ඊට අයත් යන අරුත් සපයන ඉක ප්‍රත්‍ය (ඉතිහාස+ඉක) පරව යෙදීමෙන් ඉතිහාසයට අයත් යන අර්ථ සහිත 'ඓතිහාසික' යන පදය ගොඩනැගේ. ඒ අනුව ඓතිහාසික නවකතා යන්නෙහි අර්ථය වනුයේ අතීතයට අයත් යන්න යි. නොමැති නම් අතීතය පදනම් කරගෙන ගොඩනැගුණු නවකතා යන්නයි. ඒ. වී. සුරවීර මෙසේ පවසයි:

> "ඉංග්‍රීසි The Historical Novel යන පාඨය ඓතිහාසික නවකතාව යනුවෙන් සිංහලයට පෙරලීම සාවද්‍ය ව්‍යවහාරයකි. ඓතිහාසික යන යෙදුමෙන් ගම්‍ය වන්නේ ප්‍රධාන වශයෙන් ‍ාසිඑදරසජ යන අර්ථය දෙන අතීතයට අයත් අනුස්මරණීය වැනි අර්ථයකි. මේ Historical Novel අනුව යන්නෙහි නිවැරදි අනුවර්තනය විය යුත්තේ ඉතිහාස විෂයික නවකතාව යනු ය"[1] (හේරත්, ගලප්පත්ති, අභයසුන්දර, ගෝවින්නගේ, සහ සිරි සුමන හිමි, 2009, පි. 202).

Historical Novel යන සංකල්පය හඳුනා ගැනීමේ දී Britannica විශ්වකෝෂයෙහි සඳහා ඇතුළත් විග්‍රහය වැදගත් වේ. එහි ලා ඉතිහාසයේ යම් කාල පරිච්ඡේදයක් තුළ පුද්ගල ආත්මයේ හැසිරීම් සහ සමාජ තත්ත්වයන් යථාර්ථවාදී ලෙස විස්තර කරන සහ විශ්වාසනීයත්වයෙන් යුක්ත ව නිරූපණය කරන ප්‍රබන්ධ විශේෂයක් ලෙස හඳුනා ගැනේ. Britannica විශ්ව කෝෂය මෙසේ පවසයිඃ

> "ඓතිහාසික සාධකය කෙරෙහි පවතින විශ්වාසවන්ත භාවය වැදගත් වෙයි. (ඇතැම් උදාහරණවල ද දෘශ්‍යමාන විශ්වාසවන්තභාවයක් පමණක් ඇත.) අදාළ නිර්මාණ කෘතිය සැබෑ ඓතිහාසික පුද්ගල චරිත නිර්මාණයේ වස්තු විෂයට යොදා ගනියි. රොබට් ග්‍රීව්ස් ඔහුගේ I Claudius (අයි ක්ලෝඩියස්) (1934) නිර්මාණයේ දී සිදු කරන ආකාරයෙන් මෙය සිදුවෙයි. එසේ නැතහොත් ප්‍රබන්ධාත්මක වූද ඓතිහාසික වූද සිද්ධියක මිශ්‍රණයක් අදාළ නිර්මාණයේ අඩංගු විය හැකි ය. එය ෆ්‍රාන්ස් වර්ෆෙල්ගේ (Forty days of Musa Dagh 1934) කෘතියේ දී සිදු වන අන්දමේ මිශ්‍රණයක් විය. හැකි ය. එය ඇමෙරිකානු බලකොටුවක් ආරක්ෂා කර ගැනීමේ සිද්ධිය නාටකීකරණයට ලක් කරයි. බොහෝ අවස්ථාවලදී ඓතිහාසික නවකතාව උත්සාහ කරන්නේ අතීතයේ පැවැති සමාජයක් පිළිබඳ ව පුළුල් දර්ශනයක් චිත්‍රණය

1. එහෙත් ඒ. වී. සුරවීර සාහිත්‍ය විචාර ප්‍රදීපිකා විචාර වචන කෝෂයේ Historical Novel යන්න නම් කරනුයේ ඓතිහාසික නවකතා යනුවෙනි. ඒ අනුව මුල් කාලීනව ඒ. වී. සුරවීර ද මේ සම්බන්ධයෙන් යම් පරස්පර විරෝධී ආස්ථානයක සිටි බව හඳුනාගත හැකි ය.

කොට දැක්වීමට ය. ඒ සමාජය තුළ නිරූපිත ප්‍රබන්ධිත චරිතවල පෞද්ගලික ජීවිත කෙරෙහි බලපෑමක් ඇති කර වන වැදගත් සිදුවීම්වල ප්‍රතිබිම්බයන් හට ගැනෙයි. ප්‍රථම ඓතිහාසික නවකතා ශ්‍රීමත් වෝල්ටර් ස්කොට්ගේ Waverley (1814) නවකතාව අයත් ප්‍රවර්ගයේ නවකතා ජනප්‍රියභාවය රැකගෙන පැවතී ඇත. එනමුත් ලියෝ ටෝල්ස්ටෝයිගේ War and Peace (1865-1869) හා සමාන වෙනත් ඓතිහාසික නවකතා ඉහළ මට්ටමේ කලාත්මක ගුණයෙන් යුක්ත වන අතර ඒවායෙන් බොහොමයක් නිර්මාණ ලියැවී ඇත්තේ මධ්‍යස්ථ ප්‍රමිතීන්ට අනුකූලවය. එහෙත් එක් ආකාරයක ඓතිහාසික නවකතාවක් වන්නේ මුළු මහත් ජීවිතයෙන් පලා යන ආකල්පය රැඳුණු ඓතිහාසික ඇඳුම් පැළඳුම් ලා ගත් චරිත සහිත ප්‍රේම වෘත්තාන්තයන් ය. ඒවා ඓතිහාසිකත්වය කෙරෙහි ව්‍යාජත්වයක් නිර්මාණය නොකරන අතර ප්‍රයෝජනයට ගන්නා අතීත පසුබිම අසම්භාව්‍ය වූද වික්‍රමාන්විත වූද චරිතවලට විශ්වාසවන්ත භාවය ලබා දෙයි"[2] (The Editors of Encyclopaedia Britannica, 2024).

සාහිත්‍යයෙන් ඉතිහාසයට වඩා ජීවිත පරිඥානය ළඟා කෙරෙන අතර ඉතිහාසය විසින් ලබාදෙන්නේ නියත කරුණු ඉදිරිපත් කරන දැනුමක් වන අතර කිසියම් කල්පිත ප්‍රබන්ධයක් හෝ ඓතිහාසික ප්‍රවෘත්ති ඇසුරෙන් කළ නිර්මාණයකින් ද ඉදිරිපත් වනුයේ සාර්වික සත්‍යය ම බව ය (පලිහපිටිය, අභයසුන්දර, ක්‍රිස්ටෝපර් සහ හෙට්ටිආරච්චි, 1985, පි. 46). මෙහි දී සේනානායකගේ ඉතිහාසයේ විෂයික නවකතා අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි ය.

2. And fidelity (which is in some cases only apparent fidelity) to historical fact. The work may deal with actual historical personages, as does Robert Graves's I, Claudius (1934), or it may contain a mixture of fictional and historic event, as does Franz Werfel's Forty Days of Musa Dagh (1934), which dramatizes the defense of an Armenian stronghold. More often it attempts to portray a broader view of a past society in which great events are reflected by their impact on the private lives of fictional individuals. Since the appearance of the first historical novel, Sir Walter Scott's Waverley. (1814), this type of fiction has remained popular. Though some historical novel, such as Lea Tolstoy's. War and Peace (1865 – 69), are of the highest artistic quality, many of them are written to mediocre standards. One type of historical novel is the purely escapist costume romance, which, making no pretense to historicity, uses a setting in the past to lend credence to improbable characters and adventures.

ඉතිහාස විෂයික නවකතා රචනා කිරීමේ දී සේනානායකගේ ප්‍රවේශය පිළිබඳව විමසා බැලීමේ දී නූතන ඉතිහාසකරණය කෙබඳු ආස්ථානයක පිහිටමින් සිය නවකතා රචනා කළේ ද යන්න විමසීම වැදගත් වේ. ඉතිහාසඥයකුගේ කාර්යය කුමක් ද යන්න සාකච්ඡා කරන වොල්ටයර් පෙන්වා දෙන්නේ අපවාද ප්‍රචාරණයන් සහ නීරස දේ ප්‍රකාශ කිරීමෙන් වැළකිය යුතු බව යි (රණවීර, 2005, පි. 204). ඉතිහාසය යනු නියත සිදුවීම් මාලාවක් වන අතර ඒ පිළිබඳ නූතන ඉතිහාසඥයාට නිරවුල් අවබෝධයක් මෙන් ම ප්‍රත්‍යක්ෂ දැනුමකින් යුක්ත විය යුතු ය. විශේෂයෙන් ම කල්පිතය හා ඉතිහාසය අතර සම්බන්ධය සේනානායකගේ කෘති අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි ය. සාහිත්‍යය හා ඉතිහාසය අතර සම්බන්ධය පිළිබඳ ව විමසීමේ දී ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රය (Poetics) කෘතියෙහි දී නවවන පරිච්ඡේදයේ එන කාව්‍යමය සත්‍යය සහ ඓතිහාසික සත්‍යය යන මාතෘකාව යටතේ මෙසේ පෙන්වා දේ:

> "කවියාගේ කාර්යය වන්නේ ඇත්ත වශයෙන්ම සිදු වූ දෑ විස්තර කිරීම නොව සිදු වෙතැයි සැලකිය හැකි එනම් ඒ අවස්ථාව අනුව සිදුවිය හැකි හෝ සිදු වුවමනා දෑ ඉදිරිපත් කිරීම ය. කවියාත් ඉතිහාස ලේඛකයාත් අතර ඇති වෙනස නම් කවියා පද්‍යයෙන් ද අනෙක් තැනැත්තා ගද්‍යයෙන් ද ලිවීම නොවේ. හෙරඩෝටස්ගේ කෘතියක් පද්‍යයට නැගුව ද එය ඉතිහාස ග්‍රන්ථයක් ම වෙයි. ඉතිහාස කාරයා හා කවියා අතර ඇති සැබෑ වෙනස නම් පළමුවැන්නා සිදු වූ දෑ පවසන අතර දෙවැන්නා සිදුවිය හැකි දෑ පැවසීම යි. මේ හේතුව නිසා කාව්‍ය වඩාත් දාර්ශනික ස්වරූපයක් භජනය කරන අතර ඉතිහාසයට වඩා උසස් තත්ත්වයක් දරයි" (ඇරිස්ටෝටල්, 2013, පි. 84).

ඇරිස්ටෝටල්ගේ ඉහත විග්‍රහයට යටත් ව කාව්‍යය ඉතිහාසයට වඩා දාර්ශනික අර්ථයක් ගැනෙයි. ඊට හේතු සාධක ලෙස ඔහු පෙන්වා දෙනුයේ ඉතිහාසය නියත කරුණු පමණක් දක්වන අතර කාව්‍යයට පුළුල් නිදහසක් උරුම වීම යි. නවකතා යනු මේ දෙකට ම අතර මැද පවතින්නකි (Hough, 2009, p. 151). මේ අනුව පෙනී යන්නේ බටහිර සාහිත්‍යයේ ඇතුළත් සංකල්ප පිළිබඳ සේනානායක දරූ ඔහුට ම

අනන්‍ය වූ කියවීමක් ඇති බවයි. එය එම අනන්‍ය බව තව දුරටත් වටහා ගනිමු.

ග්‍රීක සාහිත්‍යය පිළිබඳ ව සේනානායකගේ ආකල්ප මැනවින් පිළිබිඹු කරන කෘතියකි. සාහිත්‍ය සේසත් (1957) බටහිර සාහිත්‍යය හා විචාරය කෙරෙහි ඔහු දක්වන අවබෝධය මෙම කෘතියෙන් පිළිබිඹු වේ. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රය කෘතිය අධ්‍යයනය කළ හෙතෙම එම කෘතිය හා භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රය කෘතිය සංසන්දනය කරයි. එම සංසන්දනයෙන් පසු ඔහු මෙසේ පවසයිඃ

> "පැරණි ලෝකයෙහි විචාරකයන් අතරින් දෙදෙනෙක් ඉතා ප්‍රසිද්ධ ය. ඔවුන්ගේ එකෙක් ඇරිස්ටෝටල් ය. ඔහු ක්‍රිස්තු වර්ෂට පෙර සතර වන ශත වර්ෂයෙහි ග්‍රීසියේ විසුවේ ය. අනෙක් විචාරකයා භරත ය. ඉන්දියාවේ විසූ ඔහු ජීවත් වූයේ ඇරිස්ටෝටල්ගේ කාලයට ශතවර්ෂ තුන හතරකට පසු ව යයි සිතිය හැකි ය. මේ දෙදෙනා මෙතෙක් පැවත එන පොත් දෙක ලියූහ. ඇරිස්ටෝටල්ගේ පොත කාව්‍ය ශාස්ත්‍රය නමින් හඳුන්වනු ලැබේ. නමින් එසේ වුව ද එය ප්‍රධාන වශයෙන් ලිව්වේ දෘශ්‍ය කාව්‍ය අරභයා ය. ඔහු දෘශ්‍ය කාවයෙහි ගැබ්වන කතාව විභාග කොට දැක්විය" (සේනානායක, නවකතා කලාව, 2011, පි. 8).

ඇරිස්ටෝටල් දෘශ්‍ය කාව්‍ය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් අංග දෙකක් පවතින බව පෙන්වා දුන්නේ ය. එනම් ප්‍රත්‍යාවර්තනය හා ප්‍රත්‍යභිඥානය යනුවෙනි. ප්‍රත්‍යාවර්තනය නම් කතාවේ මුල් භාගය යි. මෙයින් හඳුනා ගැනෙන්නේ ක්‍රමයෙන් ආවරණය වී ආ සිද්ධි මාලාවක් ආපසු පෙරළීමෙන් කතාව සංකීර්ණ වීම හෙවත් අනපේක්ෂිත ගැටලු මතු වීම යි. නොමැති නම් කතාවේ නොයෙක් කරුණු එක් කිරීමෙන් පැටලීමකට හෙවත් සංකීර්ණත්වයට පත් කිරීම යි. මෙම පැටලුම් සහගත සංකීර්ණත්වයේ කතාව අවසානයේ ලිහීම හෙවත් පූර්වාපර සන්ධි ගැළපීම ප්‍රත්‍යභිඥානය තුළින් සිදු කෙරේ. මේ අනුව කථාවේ සංකීර්ණ කොටසක් ලිහිණු කොටසක් එකට සම්බන්ධ කිරීම විපර්යාසය නමින් ඇරිස්ටෝටල් පෙන්වා දේ. භරත විසින් රචනා කරන ලද කෘතිය නාට්‍ය ශාස්ත්‍රය වන අතර එම කෘතිය ද දෘශ්‍ය කාව්‍ය පිළිබඳ ව අදහස් දක්වයි. එහි දී දෘශ්‍ය කාව්‍යයෙහි තිබිය යුතු අංග හයක් පිළිබඳ ව භරත පෙන්වා දේ. ඒ අනුව යමින් මෙම

කෘති ද්විත්වය සන්සන්දනාත්මකව අධ්‍යයනය කරමින් සේනානායක පෙන්වා දෙනුයේ භරත හා ඇරිස්ටෝටල් යන දෙදෙනා ම ඉදිරිපත් කරන ලද අදහස් සමාන වන බව යි. ඔහුගේ මෙබඳු ශාස්ත්‍රීය විග්‍රහයක් හරහා ප්‍රකට වන්නේ බටහිර සාහිත්‍ය සංකල්ප මෙන් ම පෙරදිග සාහිත්‍ය විෂය පිළිබඳවත් පැවැති අවබෝධය යි.

සේනානායක සාහිත්‍ය සම්බන්ධයෙන් තම නිර්මාණාත්මක හා විචාරාත්මක පදනම බටහිර සාහිත්‍ය ඇසුරින් ගොඩනඟා ගත් ආකෘතිය ඔහුගේ සෙසු විචාර කෘති ඔස්සේ ද විමසා බැලිය හැකි ය. සාහිත්‍ය විග්‍රහය (1961) මේ සඳහා ගත හැකි තවත් නිදසුනකි. මෙහි දී සාහිත්‍යයේ තථ්‍යතාව, කථා පරිසරය මනුෂ්‍යවාදය, සාහිත්‍ය අංග, සාහිත්‍ය වර්ග, මිනිස් ගතිය ආදී තේමා යටතේ පරිච්ඡේද සැලැස්ම සකස් කොට තිබේ. ඒ අනුව ස්වාධීන බුද්ධිමතකු ලෙස ගොඩනැගීමේ දී ඔහු විසින් පුරුදු පුහුණු කළ ශික්ෂණයත්, සංයමයත් මඟින් සාහිත්‍යය, දර්ශනය සමාජය හා සංස්කෘතිය ආදී විවිධ විෂයයන් පිළිබඳ තියුණු පරිඥානයක් උරුම කරගැනීමේ අවකාශය සැකසුණි.

සාහිත්‍ය විග්‍රහයේ දී හෙතෙම නවකථා කලාව කෘතියෙන් ඇරඹූ විචාරාත්මක ගමන තවත් ඉදිරියට රැගෙන යයි. පෙරදිග හා අපරදිග සාහිත්‍ය රචනෝපක්‍රම ගැන තුලනාත්මකව විමසයි. අපරදිග මහා කාව්‍යය පිළිබඳ ව මෙහි දී විශේෂ අවධානයක් යොමු කෙරෙයි.

> "මම පැරැණි බොහෝ සිංහල පොත් කියවූවෙමි. එසේ ම ඉන්දියාවේ ඉතිහාසයේ සමාජ තත්ත්වයන් පිළිබඳ ඉංග්‍රීසි පොත් ද කියවීමි. මා කුඩා කල ජාතක පොතක් සද්ධර්මරත්නාවලියත් නැවත නැවත කියවූවෙමි. මේ කියවීම නිසා පැරණි ඉන්දියාව පිළිබඳ නවකතාවක් ලියන්නට මගේ සිතෙහි කලෙක සිට ම අදහසක් තිබිණ. එහෙයින් ජාතක පොත, සද්ධර්මරත්නාවලිය වැනි පොත්වල එන නොයෙක් කරුණු ලකුණු කොට තැබුවෙමි. ඒවා ඉන්දියාවේ බුදුන්ගේ කාලයෙහි හෝ ඊට පෙර කාලයෙහි සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, යාන වාහන දේශපාලනය, වෙද හෙදකම්, ගෙදරදොර ජීවිතය ආදිය ගැන ය. මම ඒවා අකාරාදී ක්‍රමයට ලිපිගොනුවල ලියා තැබීමි. ආහාර ගැන දත යුතු කළ ආහාර යන වචනය මේ ලිපි ගොනුවක පෙරළීමි. ජාතක පොත,

> සද්ධර්මරත්නාවලිය, අමාවතුර, ධර්ම ප්‍රදීපිකාව ආදී පොත්වලට වෙන වෙන ම ලිපි ගොනු තිබිණ. මෙසේ කරුණු රැස්කිරීමට ඉංග්‍රීසි ඉන්ඩෙක්ෂන් යන වචනය භාවිත කරනු ලැබේ" (සේනානායක, විනි විදිමි අඳුර, 2020, පි. 22).

සමස්තයක් වශයෙන් සේනානායකගේ සාහිත්‍යය කෘති අධ්‍යයනය කිරීමෙන් බටහිර සාහිත්‍ය සංකල්ප පිළිබඳ ව පමණක් නොව ලේඛන ශෛලිය හා සාහිත්‍යයක විධික්‍රම පවා බටහිර ආභාසයෙන් ගොඩනැගුණු බව කැපී පෙනෙයි. පූර්ව දත්ත නිරීක්ෂණය කිරීමෙන් ඇරිස්ටෝටල් වැනි ග්‍රීක චින්තකයන් සාහිත්‍යය සම්බන්ධයෙන් පළ කළ සංකල්ප ද ඉලියඩ් ඔඩිසි වැනි මහා කාව්‍යයන්ගේ බලපෑම ද ඔහුගේ කෘති තුළ දක්නට ලැබේ. එ මෙන් ම ග්‍රීක නාට්‍යකරුවන්ගේ නාට්‍ය නිර්මාණවල යොදා ගත් ශෛලිය ඔහුගේ නිර්මාණ කෘතිවල මෙන් ම සාහිත්‍ය සංකල්ප විග්‍රහ කිරීමේ දී යොදාගත් ආකාරය හඳුනා ගත හැකි ය. ප්‍රංශ සාහිත්‍යය තුළ විශේෂයෙන් එමිල් සෝලා, ගිස්ටව් ප්ලෝබර්, ගීද මෝපසාං, ඒඩ්ගා ඇලන් පෝ ආදී සාහිත්‍යකරුවන්ගේ සාහිත්‍යය කෙරෙහි සේනානායකගේ අවධානය ප්‍රබලව යොමු වී ඇත.

> "ඒඩ්ගා ඇලන් පෝ මා කෙරෙහි බොහෝ සෙයින් බල බලපෑ කෙටිකතාකරුවෙකු බව මෙහි කියන ලද්දේ ය. මගේ ඇතැම් කථාවල මේ බලපෑම බෙහෙවින් දැක ගත හැකි ය. මගේ නිධානය නමැති කෙටිකථාව එවැන්නකි. ඒඩ්ගා ඇලන්පෝ අසාමාන්‍ය චිත්ත තත්ත්වය විස්තර කිරීමට ප්‍රිය කරයි. නිධානය ද එවැනි චිත්ත තත්ත්වයක් විස්තර කරන්නේ ය" (සේනානායක, විනි විදිමි අඳුර, 2020, පි. 170).

ස්වාධීන බුද්ධිමතකු ලෙස සේනානායක ගොඩනැගීමේ දී පෙරදිග මෙන් ම අපරදිග සාහිත්‍ය මූලයන් කෙරෙහි ඔහුගේ අවධානය යොමු වූ අතර ඔහුගේ සමස්ත සාහිත්‍යය කෘති අධ්‍යයනය කිරීමේ දී අපරදිග (බටහිර) සාහිත්‍යය කෙරෙහි විශේෂ අවධානයක් යොමුව ඇති බව පෙනී යයි. සේනානායක සාහිත්‍යකරුවකු වශයෙන් සිංහල සාහිත්‍යයට යොමු වන මුල් කාලීන ව බටහිර සාහිත්‍යය සිංහල සාහිත්‍යයට හඳුන්වාදීමේ නව ප්‍රබෝධයක් ඇති වූ යුගයකි.

මේබඳු පසුබිමක බටහිර සාහිත්‍යය උත්කර්ෂයෙන් වර්ණනාවට ලක් කරන අතර තවදුරටත් සිංහල කලා ක්ෂේත්‍රයට ප්‍රවේශ වන නව කලාකරුවන්ට බටහිර සාහිත්‍යය යුතු බවද අවධාරණය කොට දක්වයි.

> "බටහිර කලාකාරයෝ මගේ සිත අභිමානයෙන් හා ගෞරවයෙන් පුරවති. ඔවුහු මගේ ළඟ නෑයෝ වන්නෝ ය. සියලු කලා නිර්මාණ මුළු මනුෂ්‍ය වර්ගයාටම අයිති හෙයිනි. ඔවුහු අප සියල්ලන් ම උදෙසා දුක් වින්දෝ ය. මට වීරයන් වන්නේ සටන් බිමෙහි දිවි පිදූ ඇතැම් පුද්ගලයන් පමණක් නොව නිශ්ශබ්ද ව තම ජීවිත කැප කළ මේ පුද්ගලයෝ ද මහා වීරයෝ වෙති. එවැනි පුද්ගලයෝ අප රට කිසි කලක විසූහු දැ යි මම නො දනිමි. සමහර විට අපේ රටෙහි නොයෙක් කැටයම් කළ ගෘහ නිර්මාණ කළ කලාකාරයන් අතර එවැන්නවුන් සිටින්ට ඇතැ යි සිතමි. මම මගේ මුළු ජීවිතයෙහි දී ම බටහිර සාහිත්‍ය කලාගාරයන් ගැන පොත පත කියවා ඔවුන් අනුගමනය කරන්නට වෑයම් කළෙමි. මතු පහළ වන සිංහල කලාගාරයන්ට ද මේ බටහිර කලාකාරයෝ ආදර්ශයක් වෙත්වා යි පතමි" (සේනානායක, විනි විදිමි අඳුර, 2020, පි. 210).

සේනානායකගේ සාහිත්‍ය භාවිතය අධ්‍යයනය කිරීමෙන් හා ඔහුගේ ම ආත්මභාෂණ ලෙසින් ඉදිරිපත් කෙරෙණ යම් යම් කරුණු අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ පොදුවේ පෙරාපරදිග සාහිත්‍යය ඇසුරෙන් පෝෂණය ලැබුව ද බටහිර සාහිත්‍යය කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කිරීමට පෙලඹී ඇති බව යි. මෙම පසුබිම තුළ සිට සේනානායක ඉතිහාස විෂයයික නවකතා රචනා කිරීමට යොමු වූ ආකාරය හඳුනා ගත හැකි ය. පැරණි භාරතීය සමාජය ද ඔහුගේ ඉතිහාස විෂයයික නවකතා සඳහා අත්දැකීම් ලෙස යොදා ගැනුණ ද එහි චරිත නිරූපණය, ආකෘතිය, වාග් ශෛලිය ආදී සියලු ශිල්පීය ප්‍රයෝග සියල්ල ම පාහේ මූලික වශයෙන් බටහිර සාහිත්‍යය ඇසුරෙන් යොදා ගැනීමට යොමු වී තිබේ. ඒ අනුව ඉතිහාස විෂයයික නවකතා රචනා කිරීමේ දී බටහිර සාහිත්‍යයේ ආභාසය නිරූපණය වන්නේ කෙසේ ද යන මූලික අධ්‍යයනය මේධා, චාරුමුඛ, මුදුපාණි හා වරදත්ත යන නවකතා ඇසුරෙන් සාකච්ඡාවට ලක් කෙරේ.

සේනානායකගේ ඉතිහාස විෂයික නවකතා පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී නවකතාවේ මූලිකාංග ලෙස චරිත නිරූපණය, ආකෘතිය, භාෂාව ආදී ලක්ෂණ පිළිබඳ අවධානය යොමු කරමින් සේනානායකගේ යොදාගත් ප්‍රවේශය ඔස්සේ ඔහුගේ නවකථා කලාව (1946), සාහිත්‍ය ධර්මතා (1963), සාහිත්‍ය විග්‍රහය (1961) ආදී කෘති හරහා හඳුනාගත හැකි ය. පොදුවේ නවකතාව ඇතුළු සමස්ත සාහිත්‍ය කතිකාවට ඔහුගේ ඇති දායකත්වය ගොඩනැගීමේ දී බටහිර සාහිත්‍යයේ ආභාසය ලැබුව ද අපගේ පර්යේෂණයේ මාතෘකාව සේනානායකගේ ඉතිහාස විෂයික නවකතා වෙත සීමා වන නිසා ම එම නවකතා පිළිබඳ ඔහුගේ ආස්ථානය විග්‍රහයට ලක් කිරීමට මෙහි දී අපේක්ෂා කෙරේ.

සේනානායක ඉතිහාස විෂයක නවකතා (Historical Novel) හඳුනාගන්නේ ඉතිහාස නවකතා (සේනානායක, සාහිත්‍ය විග්‍රහය, 1998) යනුවෙනි. ඔහුගේ මෙම ප්‍රවේශය තුළ ඉතිහාසය පිළිබඳ පූර්ණ විනිශ්චයකින් යුතු ව ඊට අයත් මිනිසුන්ගේ හා සමාජ පරිසරය ද සංස්කෘතිය ඇතුළු ආචාර විධි, ධර්මතා ඉතිහාසය තුළ ක්‍රියාත්මක වූ ස්වභාවය අධ්‍යයනය කරමින් රචනා කෙරෙන ප්‍රබන්ධමය ගුණයෙන් යුක්තව වූ ඉතිහාස විෂයික නවකතා රචනා කිරීම සඳහා යොමු වූ ආකාරය හඳුනාගත හැකි ය. ජී. බී. සේනානායකගේ ඉතිහාස විෂයික නවකතා සඳහා පසුබිම් වූයේ පුරාණ භාරතීය ප්‍රභූ සමාජය යි. කාල හා අවකාශීය වශයෙන් මෙම නවකතා ඓතිහාසික ප්‍රවේශයක් තුළ ගොඩනැගුණ ද චරිත නිරූපණය තුළ නූතනවාදී ලක්ෂණ හඳුනා ගත හැකි ය. 'මේධා' නවකතාව තුළ මේධා, සෝම, උපදත්ත, සුගුත්ත, රේණුක ආදී චරිත නිරීක්ෂණයට ලක් කිරීමෙන් මෙම තත්වය හඳුනාගත හැකි ය. 'මේධා' නවකතාව තුළ මුණගැසෙන 'මේධා' නම් ප්‍රධාන චරිතය සෝම නම් ධනවතකුගේ බිරිඳ යි. ඇය කෲර ස්වභාවයෙන් යුතු ගැහැනියක ලෙස නවකතාව ආරම්භයේ නිරූපණය කෙරේ. ඇගේ චිත්ත චෛතසික ස්වභාවය නිරූපණය කරන සේනානායක ඇගේ චරිතය වර්තමාන සමාජයේ මධ්‍යම පාන්තික කුටුම්භ සංස්ථාවක වෙසෙන ස්ත්‍රියක ලෙස ගොඩනගයි. උපදත්තගේ දියණිය වන කපිලානි ඝාතනය කරවීමෙන් පෙනී යන්නේ ඇය තම දරුවන්ගේ උන්නතිය වෙනුවෙන් ඕනෑ ම සාපරාදී ක්‍රියාවක නිරත වන බව යි.

සේනානායකගේ නවකථාකරණය විමසා බැලූ විට කැපී පෙනෙන කාරණයක් වන්නේ ස්ත්‍රී චරිත ප්‍රධාන චරිත ලෙස හෝ

බලපෑම් සහගත චරිත ලෙස ගොඩනැගීමයි. මේධා, මුදුපාණී වැනි නවකථාවල පමණක් නොව පිරිමි චරිත ප්‍රධාන චරිත ලෙස තෝරාගත් චාරුමුඛ, වරදත්ත වැනි නවකථාවල ද ස්ත්‍රී චරිත සුවිශේෂ කාර්යයක් ඉටු කරයි. සේනානායකගේ මෙම චරිත ගොඩනැගීම ගැන ඔහු තම ජීවිත කථාවක දී පවසන්නේ ශෙක්ෂ්පියර්ගේ නාට්‍යවලින් ලද ආභාසය ඒ ගොඩනැගීම් වෙත බලපෑම් එල්ල කළ ආකාරය යි. තම නවකථාවල ස්ත්‍රී චරිත බහුල වීම ගැන පාඨකයෙක් ඇසූ ප්‍රශ්නයක් මුල් කොට ගනිමින් මෙම සංවාදය ගොඩනගන සේනානායක එහි දී තම නිර්මාණ ගැන පවසමින් ශෙෂ්පියර්ගේ නාට්‍ය පිළිබඳ සාකච්ඡා කරයි. මෙම සාකච්ඡාව සේනානායකගේ සාහිත්‍ය විචාර සමඟ ද සම්බන්ධ කර ගනිමින් එක් කතිකාවක කොටසක් ලෙස සලකා බැලිය හැකි ය. ඒ අනුව බටහිර ශ්‍රේෂ්ඨ නවකථා කෘතියෙහි ඇනා කැරනිනා හා එමා බොවාරි නවකතා දෙක පිළිබඳ ඔහු පවසන අදහස් ද මෙහි ලා සැලකිල්ලට ගත හැකි ය. ශෙෂ්පියර්ගේ නාට්‍යය මෙන් ම එම නවකථා දෙක තුළ ද ස්ත්‍රී භූමිකාව ප්‍රබල වෙයි. සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ස්ත්‍රීන් පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී පවා බටහිර නවකථා සමඟ සංසන්දනය කිරීම සේනානායකගේ ක්‍රමවේදය බව නවකථා කලාවේ ඇතුළත් පහත සාකච්ඡාවෙන් පෙනී යයි.

> "පටාචාරා කතාව තෝමස් හාර්ඩි නමැති ඉංග්‍රීසි නවකථාකාරයාගේ Tess of D'Urevilles නමැති දිග නවකථාව සිහි ගන්වයි. පසු ව පටාචාරා යන නමින් ප්‍රසිද්ධ වූ මේ සිටුදුව බුද්ධියට වඩා ආශාවන්ට වහල් ව ක්‍රියා කරන හොඳ හදවතක් ඇති ගැහැනියකි. තෝමස් හාර්ඩිගේ නවකථාව ද එවැනි තරුණිය විපත් පෙළකට මුහුණ පෑ සැටි කියන්නෙකි. ඇතැම් විට මිනිස්සුන්ට පිළිවෙළින් විපත් පෙළකට මුහුණු පාන්නට සිදු වෙයි. මෙසේ විපත් වැල නොකැඩී පැමිණෙන සැටි, සලකන කෙනෙක් එසේ විපත් පැමිණෙන්නේ කර්මය නිසා යයි කියති. විපත්වලට හේතුව දෙවියන්ගේ නියමය ය යි තවත් කෙනෙක් කියති. කර්මය හෝ කිසි දෙවියකු හෝ ඇති බව නො සලකන්නෝ හේතුව වශයෙන් ලෞකික කරුණු දක්වති. හේතුව කුමක් වුවත් ඇතැම් විට මිනිසුන්ට විපත් වැලකට මුහුණ පාන්නට සිදුවන බව ද විපත්වලට

මුහුණ පාන්නවුන් දුකින් ගැලවෙන්ට කරන උත්සාහය බොහෝ විට නිෂ්ඵල වන බව ද සාමාන්‍යයෙන් මෙසේ විපත්වලට මුහුණ පෑමට සිදුවන්නේ බුද්ධියට වඩා හැඟීම් විසින් මෙහෙයණු ලබන්නවුන්ට බව ද සත්‍යයකි. පටාචාර කථාව ද තෝමස් හාර්ඩිගේ කථාව ද ප්‍රකාශ කරන්නේ මේ සත්‍යය ය. සද්ධර්මරත්නාවලිය පටාචාර කථාව කියන්නේ ජීවිතයෙහි අත්දැකීම් නිසා පැසුණු බුද්ධිය ඇත්තකු ජීවිතය නම් මෙසේ ය යි අකම්පිතව විස්තර කරන්නාක් මෙනි. එහෙත් තෝමස් හාර්ඩි තම කථාව කියන්නේ ජීවිතයෙහ දුක් පීඩා දැක කම්පිත වූ ගැහැනියක් විලාප නගන්නාක් මෙනි" (සේනානායක, නවකතා කලාව, 2011, පි. 637.

එ මෙන් ම සන්දර්භය, චරිත නිරූපණය, ශෛලිය ආදී සාහිත්‍ය කෘතියක මූලික ව්‍යුහය පරීක්ෂා කිරීමේ දී බොහෝ විට හෙතම බටහිර සාහිත්‍ය කතිකාව තුළින් උකහා ගන්නා දැනුම බහුල ලෙස උපයෝගී කොට ගනියි. නිදසුනක් ලෙස නවකථා කලාව කෘතියේ දී පළමු පරිච්ඡේදය විමසා බැලිය හැකි ය. එහි දී කථා කලාවේ විවිධ පාර්ශ්ව ගැන සාකච්ඡා කරමින් ඔහු කාලිදාසගේ ශාකුන්තලය මෙන් ම පෙරදිග ප්‍රකට වූ උපදේශ කථා ඇතුළත් ග්‍රන්ථයක් වන හිතෝපදේශයේ ඇතුළත් කථාවක් ද සාකච්ඡා කරන අතර මග ඒවා ගීද මෝපසන් හා ඇන්ටන් චෙකොන්ගේ කෙටිකතා සමඟ සංසන්දනාත්මකව විමසා බලයි.

සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය තුළ තිබෙන වඩාත් ප්‍රචලිත කථා සංග්‍රහ දෙක වන ජාතක පොත හා සද්ධර්මරත්නාවලිය බටහිර කෙටිකතා නිර්මාණ සමඟ සමාන්තර ලෙස ගෙන සාකච්ඡා කරන ඔහු මෙසේ පවසයිඃ

> "ජාතක පොතෙහිත් සද්ධර්මරත්නාවලියෙහිත් ඇතැම් කථාවල එන අදහස් හා වස්තු සුදුසු වන්නේ කෙටිකතා නොව දිග කථා ලියන්නට ය" (සේනානායක, නවකතා කලාව, 2011, පි. 77).

සම්භාවය සිංහල සාහිත්‍යයෙහි ගැබ්වන කතා කලාව නූතන කෙටිකථාවේ ආකෘතික පාර්ශවය සමඟ සසඳන ඔහු එබඳු නිගමනයක එළඹේ. තව ද පෙරදිග දැනුම් පද්ධති විමර්ශනයේ කිරීමේ දී සැම

විට ම නූතන දැනුම් පද්ධතිවල ප්‍රබල ආලෝකය ලබා ගැනීම ඔහුගේ විධික්‍රමය යි. පහත උදාහරණ ඒ සඳහා පෙන්වා දිය හැකි යː

> "පැරණි ඉන්දියාවෙහි ප්‍රධාන කාව්‍ය ශාස්ත්‍රවාද හතරක් පහළ විය. මේ වාදවල හරය වූයේ මනෝවිද්‍යාවයි" (සේනානායක, සාහිත්‍ය දර්ශන සිතුවිලි, 2018, පි. 73).

> "හොඳ නරක පිළිබඳ හැඟුමට අපි බොහෝ දෙන ඉංග්‍රීසි ව්‍යවහාරයට අනුව හෘදය සාක්ෂිය යයි ද මනෝ විද්‍යාඥයෝ උත්තර ආත්ම හැඟීම යයි ද කියති" (සේනානායක, සාහිත්‍ය දර්ශන සිතුවිලි, 2018ල, පි. 47).

එ මෙන් ම තමා ඓතිහාසික නවකථා රචනා කිරීම සඳහා ජාතක පොත සද්ධර්මරත්නාවලිය ආදිය දිගු කාලීන ව කියවා ක්‍රමානුකූල ව විශාල තොරතුරු සංහිතාවක් එක් කළ බව පවසන ඔහු අවසානයේ දී පෙන්වා දෙන්නේ එම තොරතුරු සාහිත්‍ය නිර්මාණකරණය සඳහා යොදා ගැනීම පිණිස නූතන ශික්ෂණයන්ගෙන් ලද ආභාසය යිː

> "මා මේ පොත් දෙකන් (ජාතක පොත හා සද්ධර්මරත්නාවලිය එම පොත් දෙකයි.) උගත්තේ ඓතිහාසික සමාජයක් පිළිබඳ කරුණු පමණක් නොවෙයි ඒ සමාජය ආර්ථික කරුණු දේශපාලනයෙ අධ්‍යාපනය ආදියෙන් අපේ සමාජයට වෙනස් ය. මිනිසුන්ගේ රුචි අරුචිකම් ක්ලේශයන් ප්‍රකාශයට පත්වන අයුරු ආදිය සමාජයට අනුව වෙනස් වෙන බව මානව විද්‍යාඥයොත් සමාජ විද්‍යාඥයන් හා මනෝවිද්‍යාඥයොත් පෙන්වාදෙති විද්‍යාඥයොත් පෙන්වා දෙති" (සේනානායක, සාහිත්‍ය දර්ශන සිතුවිලි, 2018, පි. 27).

මේ අනුව සේනානායක තම සාහිත්‍ය චින්තනය නිර්මාණය කරගැනීමෙහි ලා පෙරදිග හා සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ඥාන මීමංසාව උපයෝගී කොටගත් නමුත් ඒ සෑම අවස්ථාවක ම පාහේ එම ඥානය ප්‍රායෝගික භාවිතයට මඟ පෙන්වාලිම සඳහා බාහිර දැනුම් පද්ධතිය ද උපයෝගී කොටගත් බවයි.

'චාරුමුඛ' නවකතාවේ චාරුමුඛ යනු මහ සිටු තනතුරු ලබා ගැනීමේ අරමුණින් තම පියා හට වස පානය කරවා පසු කාලීන ව එය හෙළි වූ පසු එම වස ම කා දිවි නසා ගත් පුද්ගලයෙකි. බලය

නිසා පුද්ගල චරිත පරිහානියට පත්වීමත් ඒ තුළ ඔවුන්ගේ චිත්ත ස්වභාවයන් ක්‍රියාත්මක වන ආකාරයත් සේනානායක විසින් සියුම් නිරීක්ෂණයට ලක් කෙරේ. ඔහුගේ සෑම ඉතිහාස විෂයික නවකතාවක ම මුණගැසෙන සෑම පුරුෂ චරිත මෙන් ම ස්ත්‍රී චරිත මනෝ විශ්ලේෂණාත්මක පදනමක තබා රචනා කිරීමට යොමු වී ඇති ආකාරය එම චරිතයන්ගේ චෛතසික ස්වභාවය නිරීක්ෂණය කිරීමෙන් හඳුනාගත හැකි ය. නවකතා තුළ ගොඩනගන සෑම චරිතයක ම චිත්ත ස්වභාවය නිරූපණය කිරීමට පූර්වයෙන් ඒ චරිතයන්ට අදාළ බාහිර ස්වභාවය හඳුන්වා දීමට යොමු වෙයි. ඒ ඔස්සේ පාඨකයා තුළ ඒ චරිතය පිළිබඳ පූර්ව නිගමනයන් ගොඩනැගීම අරමුණෙනි. 'මේධා' නවකතාව තුළ ආරම්භයේ මේධාගේ චරිතය ආත්මාර්ථකාමී කෲර චරිතයක් ලෙස නිරූපණය කළ ද නවකතාව අවසානයේ ඔහු ඇගේ චරිතය ඊට හාත්පස ප්‍රතිවිරුද්ධ චරිතයක් ලෙස ගොඩනග යි. ඒ හරහා ඔහු පාඨකයා එම චරිත පිළිබඳ ගොඩනගාගත් පූර්ව නිගමනයන් බිඳ දමා වෙනස් ම මානයක් වෙත රැගෙන යයි. 'මුදුපාණි' නවකතාව තුළ මුදුපාණිගේ චරිතය ද නවකතාව තුළ මෙහෙය වනුයේ ද ඉහතාකාරයෙනි. මෙය අනුව ඔහුගේ චරිත නිරූපණයෙන් මෙන් ම නවකතාවල ආකෘතිය වඩාත් සමීප වනුයේ බටහිර නවකතාවේ මඟයි.

මේධා, මුදුපාණි වැනි නවකථාවල පසුබිම, චරිත ආදිය මුළුමනින් ම පෙරදිග සමාජය මත ගොඩනැගී ඇතත් එම චරිත ජාතක පොත, සද්ධර්මරත්නාවලිය වැනි කෘතිවල ඇතුළත් ස්ත්‍රී චරිතවලට වඩා ළංවන්නේ නූතන බටහිර යථාර්ථවාදී නවකථාවල නිරූපණය වී ඇති ස්ත්‍රී චරිතවලට ය. එයට හේතුව වන්නේ එම චරිත ගොඩනගා ඇත්තේ හා විකාසනය කොට ඇත්තේ පැරණි කථා කලාවේ සන්දර්භය තුළ නො ව නූතන යථාර්ථවාදී නවකතාවේ සන්දර්භය තුළ වීම නිසා ය. නූතන පෙරදිග උසස් නවකථා ගෙන බැලූ විට (නිදසුනක් වශයෙන් රවින්ද්‍රනාත් ඨාගෝර්ගේ ගෝරා, විභූති භූෂණ බන්දොය්පාද්‍යයගේ අපූ ත්‍රිත්වය) පවා පෙනී යන්නේ එම කෘති පෙරදිග අත්දැකීම් මත රචනා වූ නමුත් ශිල්පීය වශයෙන් බටහිර යථාර්ථවාදී නවකථාව අනුගමනය කළ ආකාරය යි. මේ අනුව පෙනී යන්නේ සේනානායක බටහිර යථාර්ථවාදී නවකථාවේ මූලධර්ම තම ඓතිහාසික නවකථාවල දී භාවිත කළ ආකාරය යි.

> "නවීන නවකතාකාරයා බාහිර ලෝකයේ සිදුවීම්වලට වඩා මිනිසුන්ගේ චිත්තාභ්‍යන්තරය විස්තර කිරීමට තැත් කරයි. දිග ගද්‍ය කතාව නවකතාව යන නමින් හැඳින්වීම ආරම්භ වූයේ ජීවිතය විස්තර වන ලෙස කතා ලිවීම ආරම්භ වූ පසු ය" (සේනානායක, නවකතා කලාව, 2011, පි. 21).

සේනානායක නවකතා රචනා කිරීමේ දී පෙන් වූ විචක්ෂණ භාවය 'නවකතා කලාව' කෘතිය ඔස්සේ හඳුනාගත හැකි ය (සේනානායක, විනි විදිමි අඳුර, 2020, පි. 21). ඔහුගේ 'නවකතා කලාව' කෘතිය තුළ ඔහු නවකතාවක ආකෘතිය, චරිත නිරූපණය ආදි ශිල්පීය ලක්ෂණ පිළිබඳ පුළුල් විග්‍රහයක නිරත වේ. විශේෂයෙන් ම චරිත නිරූපණය තුළ ඔහු බටහිර නවකතාකරුවන් ගත් ප්‍රවේශය ඔහු පෙන්වා දේ. එ මෙන් ම 'බටහිර ශ්‍රේෂ්ඨ නවකතා' (1960) නමැති කෘතිය මගින් බටහිර නවකතාකරුවන්ගේ නිර්මාණ පිළිබඳ ඔහු සිදු කරන විවරණය තුළ නවකතාව හා නවකතාවේ අංග පිළිබඳ පෘථුල අවබෝධයකින් යුක්ත වූ බව පෙනේ. විශේෂයෙන් ම බටහිර නවකතාකරුවන් යොදාගත් ශිල්පීය ක්‍රම පිළිබඳ තුලනාත්මක විවරණය ඔහු විසින් සිදු කෙරේ. මේ හරහා ඔහුගේ ඉතිහාස විෂයික නවකතා ගොඩනැගීමේ පසුබිම සැකසී ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. සේනානායක බටහිර නවකතාවල ආභාසය ලබමින් ඉතිහාස විෂයික නවකතා රචනයේ දී යොදාගත් අවස්ථා සන්සන්දනාත්මකව අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි ය.

> "ඇ රජුට පිටුපස හරහා ගැහැණුන් සමග කතා කරන විටද ඇගේ සිත යොමු වී ඇත්තේ රජු කෙරෙහි ය. ඊට එක් හේතුවක් ඇගේ සිතෙහි ඔහු පිළිබඳව වරින් වර මතුවන අරගලයක් ඇති වීමය. රජු හා ආශ්‍රය කරන්නන්ට තමා තුළ මහත් ආශාවක් ඇතැයි ඇ සිතයි. ඒ අවස්ථාවේදී පමණක් නොව ඇ දකින සෑම විටම ඔහු ලෝභ බැල්මෙන් තමා දෙස බලන බව ඇ දන්නීය" (සේනානායක, මුදුපාණි, 2001, පි. 11).

ලියෝ ටෝල්ස්ටොයිගේ 'ඇනා කැරනිනා' නවකතාවේ එන ඇනා සහ රොන්ස්කිගේ ප්‍රේමය තුළ ඇනාගේ සිතුවිලි ක්‍රියාත්මක

වන ආකාරය මුදුපාණිගේ සිතුවිලිවල ස්වභාවය නිරූපණය කිරීමේ දී සේනානායක යොදා ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

> "වදනකුදු නොතැපෙළා ඈ ඔහු දෙස මොහොතක් බලා සිටියා ය. ඔහු ආලෝකයට පිටුපා සිටියත් ඈ ඒ මුහුණෙන් දෑසෙන් හැඟුම් දුටුවා ය. දුටුවා යැයි ඈ ඇයට සිතුණේ ය. පෙරදා ඔහු ඇය දෙස බලා සිටියේ ද ගෞරවය හා ප්‍රශංසාව මුසු බැල්මෙන් ය. ඇය වශීකෘත වී ගියේ ඒ බැල්මෙන් ය" (ටෝල්ස්ටෝයි, 2006, පි. 100).

ජී. බී. සේනානායකගේ නවකතා රචනයේ දී චරිත නිරූපණය පිළිබඳ ව තවදුරටත් විමසා බැලීමේ දී කැපී පෙනෙන ලක්ෂණයක් නම් පුද්ගල චරිතයන්ගේ චිත්ත චෛතසික ස්වභාවය ක්‍රියාත්මක වන ආකාරය ඔහු නිරූපණය කරන ආකාරය යි. එහි දී ඔහු විසින් මනෝවිශ්ලේෂණාත්මක ප්‍රවේශයක් හරහා එම චරිත නිරූපණය කිරීමට සලස්වයි

> "කුණාටුව හැමූ සැටි ඇසූ කල ඔහු තුළ තැතිගැන්මක් ඇති විය. තම නැව ගල් පරය පසු කළ බව ඇසූ කල සතුටක් පහළ විය. අනික් නැව ක්‍රමයෙන් ගල්පරයට ළං වන විට බයක් පහළ වූයේ ය. නැව කැඩී මිනිසුන් මුහුදුබත් වූ බව ඇසූ විට අනුකම්පාවක් හටගත්තේ ය. මේ හැඟීම් හා මිශ්‍ර වූ තවත් හැඟීමක් ඔහු තුළ පහළ වී ය. එය අනික් නැව කැඩී විනාශ වී යන සතුටකි. මහ නැවියා කතාව අවසන් කළ විට, ඒ සතුට බෙහෙවින් වැඩි විය. තමා තුළ සතුටක් ඇත යන අදහස ඔහුට අප්‍රසන්නය. එහෙයින් එය කෙරෙහි සිත යොමු කරන්නට ඔහු අකැමැති ය. වෙනත් රටක තමා නොහඳුන ශිල්පියකුගේ මරණය ගැන අසා 'අයියෝ' යි කී ඔහු තමා දන්නා හඳුනන්නකුගේ නැවක නැවියන් මුහුදෙහි ගිලී මල බව අසා කම්පා නොවී ය" (සේනානායක, මේධා, 2014, පි. 40).

සේනානායක බටහිර ගොඩනැගුණ මනෝවිද්‍යාත්මක ප්‍රවේශය චරිත නිරූපණය තුළ යොදාගත් ආකාරය හඳුනාගත හැකි ය. චරිත තුළ ක්‍රියාත්මක වන ද්විරූපතාව ඔහු ගොඩනගන සෑම ප්‍රධාන චරිතයක් තුළ ම ගැබ්ව පවතී. සිතෙහි ඇති වන ඒ චිත්ත ගැටුම

පුද්ගල අවිඥානයේ සැඟව පවතින ධර්මයන් ක්‍රියාත්මක වීම චරිත හරහා මතු කෙරෙයි.

> "මිනිස් චරිත ඉතා ගැටලුව. එහි මසුර හා නිර්ලෝභය ද, කෲරත්වය හා දායාව ද, උඩගුකම හා නිහතමානය ද වෙනත් පරස්පර විරෝධ ගුණ ද වෙයි. සාහිත්‍යයේ චරිත නිර්මාණය කරන විට සාමාන්‍යයෙන් මෙම සංකීර්ණත්වයෙන් කිසිවක් දැක්විය යුතු වේ" (සේනානායක, සාහිත්‍ය විග්‍රහය, 1998, පි. 122).

## නිගමනය

ජී. බී. සේනානායකගේ ඉතිහාස විෂයික නවකතා රචනා කිරීමේ දී ඔහුගේ ප්‍රවේශය මූලික වශයෙන් බටහිර සාහිත්‍ය සංකල්ප කෙරෙහි යොමු වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. ඔහු විසින් රචනා කරන ලද මේධා, චාරුමුඛ, වරදත්ත, මුදුපාණි යන නවකතා තුළ යොදාගත් ශිල්පීය ක්‍රම සඳහා උදාහරණ සපය යි. විශේෂයෙන් ම ඔහු බටහිර ආභාසය ලබා ඇත්තේ නවකතාවේ චරිත නිරූපණ ක්‍රියාවලිය සඳහා ය. ධනය, බලය හා කාම තෘෂ්ණාව හේතුවෙන් පුද්ගල චිත්ත ධර්මතා සංකීර්ණත්වයට පත්වන ආකාරය සේනානායක නිරූපණය කරනුයේ රුසියානු, ප්‍රංශ නවකතාවල ආභාසය ලබමිනි. දිගු කාලීන ව බටහිර සාහිත්‍ය අධ්‍යයනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ නවකතා තුළ මෙම ලක්ෂණ නිරූපණය වේ. කාල හා අවකාශමය වශයෙන් ඔහුගේ ඉතිහාස විෂයික නවකතා පුරාණ භාරතීය ප්‍රභූ සමාජය නියෝජනය කළ ද පුද්ගල චරිත නූතනවාදී ප්‍රවේශයක් ගත්තේ ය. ලියෝ ටෝල්ස්ටොයිගේ 'ඇනා කැරනිනා', ඔනෝරේ. ඩි. බල්සාක් 'මහලු ගෝරියෝ' ඇන්ටන් චෙකොෆ්, ගී ද මෝපසං ආදී බටහිර නවකතාකරුවන්ගේ නවකතා ඔස්සේ මතු කෙරෙන යථාර්ථවාදී කතා කලාව ඔහුගේ නවකතා තුළ අනුකරණය කෙරේ. විශේෂයෙන් ම එම නවකතා සඳහා පසුබිම් වන ප්‍රභූ සමාජයත්, මධ්‍යම පන්තියත් නියෝජනය කළ පුද්ගල චරිතයන්ට සමාන චරිත සේනානායක ද අනුකරණය කිරීමට යොමු වී ඇත. නවකතාවේ ආකෘතිය ද සේනානායක සමහර අවස්ථාවන්හි දී වෙනසකට ලක් කරමින් නවකතාව තුළ නව අත්හදාබැලීම් සිදු කරයි. නවකතාව ආරම්භයේ සිට අවසානය දක්වා ම කුතුහලය වඩමින් පාඨකයා නවකතාව අවසානය දක්වා ම රැගෙන

යාමට හෙතෙම සමත් වේ. චරිත නිරූපණයේ දී සේනානායක ඒ ඒ චරිතයන්ගේ බාහිර ස්වභාවය විවරණය කිරීම, චෛතසික ගැටුමක් ගොඩනැගීම, ස්වයංව චරිත නවකතාව තුළ නිරූපණය වීමට ඉඩ සැලසීම ආදී ශිල්පීය ක්‍රම භාවිත කිරීමට යොමු වී ඇත. එ මෙන් ම නවකතාවේ චරිත විසින් ම චරිත පිළිබඳව නිරූපණය කිරීමට යොමු වීම. (මේධා නවකතාවේ එන රේණුකගේ බිරිඳ යසසේනා විසින් මේධාගේ චරිතය නිරීක්ෂණය කිරීමෙන් ඒ බව හඳුනාගත හැකි ය.) සේනානායක බටහිර සාහිත්‍ය සංකල්ප හා බටහිර නවකතාකරුවන්ගේ සාහිත්‍ය භාවිතය ස්වයං අධ්‍යයනයකට ලක් කිරීමේ ලැබූ ආභාසය මේ ඔස්සේ හඳුනාගත හැකි ය. නවකතා රචනා කිරීමේ දී භාරතීය පුරාණ සමාජ පසුබිම් කොටගත්ත ද ඒ චරිත විකාසනය තුළ නූතනවාදී මෙන් ම දේශීයත්වයට සමීප විය (සේනානායක, විනි විඳිමි අඳුර, 2020). විශේෂයෙන් ම මෙම අධ්‍යයනය හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණයක් නම් බටහිර සාහිත්‍ය සංකල්ප සේනානායක විසින් අන්ධානුකරණයෙන් භාවිතයට නොගත් අතර ඒ පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයකින් යුක්තව යොදාගත් බවයි.

> "අප බටහිරින් උගත යුත්තක් ඇත්නම් උගත යුතු ය. අන්ධ ලෙස අනුගමනය නොකළ යුතු ය. අප අපේ පැරණි සම්ප්‍රදායට වහල් වීම ද නුසුදුසු ය. අනුන්ගෙන් ඉගෙන අපේ ම මගක යා යුතු ය" (සේනානායක, සාහිත්‍ය දර්ශන සිතුවිලි, 2018, පි. 76).

ජී. බී. සේනානායක ස්වාධීන බුද්ධිමතකු ලෙස පෙරදිග මෙන් ම අපරදිග (බටහිර) සාහිත්‍යය අධ්‍යයනය කිරීමෙන් සාහිත්‍ය තුළ සිය අනන්‍යතාවය ගොඩනැගීමට යොමු වී ඇති ආකාරය මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. එහි දී ඔහු පෙරදිග සාහිත්‍යය තුලනාත්මක ව විමසා බැලීමටත් යොමු විය. එහෙත් ඔහුගේ බොහෝ සාහිත්‍ය කෘති පිළිබඳ අවධානය කිරීමේ දී බටහිර සාහිත්‍ය සංකල්ප කෙරෙහි අවධානය යොමු වී ඇත. විශේෂයෙන් ඔහු විසින් රචනා කරන ලද මේධා, චාරුමුඛ, වරදත්ත හා මුදුපාණි යන ඉතිහාස විෂයික නවකතා රචනා කිරීමේ දී බටහිර සාහිත්‍යයේ ආභාසය බලපෑ බව මෙහි දී නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Hough, G. (2009). *සාහිත්‍ය විචාරය*. (රාණි සේනාරත්න, පරි.), කොළඹ, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

*The Editors of Encyclopaedia Britannica*. (2024, 11 16). historical novel. Retrieved from britannica: https://www.britannica.com/art/historical-novel

ඇරිස්ටෝටල්. (2013). *කාව්‍ය ශාස්ත්‍රය*, (සූරවීර, පරි.), නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

ටොල්ස්ටෝයි, ලියෝ. (2006). *ඇනා කැරනිනා*, (රාණි සේනාරත්න, පරි.), නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

පලිහපිටිය, අභයසුන්දර,. ක්‍රිස්ටෝපර්,. සහ හෙට්ටිආරච්චි,. (සංස්.) (1985). සූරවීර, කල්පිතය හා ඉතිහාසය. *ජී. බී. සේනානායක ප්‍රභාෂණ.*

රණවීර, ලෙස්ලි ගුණවර්ධන. (2005). *ඉතිහාසයේ අතීතය, ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (2001). *චාරුමුඛ*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (2011). *නවකතා කලාව*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (2002). *බටහිර ශ්‍රේෂ්ඨ නවකතා*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (2013). *මගේ සිතුම් පැතුම් හා ජීවිතය*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (2001). *මුදුපාණි*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (2014). *මේධා*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (වර්ෂය සඳහන් නොවේ). *වරදත්ත*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (2020). *විනි විඳිමි අඳුර*, රතුපස්වල, තරංග ප්‍රකාශකයෝ.

සේනානායක, ජී. බී. (2018). *සාහිත්‍ය දර්ශන සිතුවිලි*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (2007). *සාහිත්‍ය ධර්මතා*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. බී. (1998). *සාහිත්‍ය විග්‍රහය*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායකථ ජී. බී. (2009). *සාහිත්‍ය සේසත්*, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හේරත්,. ගලප්පත්ති,. අභයසුන්දර,. ගෝවින්නගේ,. සහ සිරි සුමන හිමි,. (2009). *සාහිත්‍ය විශේෂ කලාපය.*